සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

**10 ශ්‍රේණිය** # පෙරදිග සංගීතය **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ස රි ග ම ප ධ නි ස්̇ යනුවෙන් ආරෝහණ ස්වර යෙදෙන රාගය
(1) යමන් (2) බිලාවල් (3) භෛරවී (4) භීමපලාශ්‍රී

02 නිරිගරිස , පමගරිස යන මුඛ්‍යාංගය යෙදෙන රාගය
(1) යමන් (2) භූපාලි (3) කාෆි (4) භීමපලාශ්‍රී

03 ස ධ ප ධ | ම ප ග ම | නි ධ - ස | - රි ග ම මෙම සර්ගම් පාදය නිවැරදිව සැකසූ විට
(1) ම තීව්‍ර වේ. (2) ග නි කෝමල වේ.
(3) රි ග ධ නි කෝමල වේ. (4) කිසිදු වෙනසක් සිදු නොවේ.

04 𝄋 ස්වර ලිපියක මෙම සලකුණෙන් දැක්වෙන්නේ,
(1) මෙම සලකුණ ඇති ස්වර ඛණ්ඩය නැවත වාදනය කළ යුතු බවයි.
(2) මෙම සංකේතය මුලින් යෙදූ ස්ථානයට නැවත පැමිණිය යුතු බවයි.
(3) තාලය හඟවන සංකේතයයි.
(4) ගීතයේ සෘතිය හැඳින්වීම සඳහා ය.

05 බැස සීතල ගඟුලේ, එන්ඩද මැණිකේ මමත් දියඹටා, පොඩිමල් එතනෝ වැනි ගීත ග්‍රැමෆෝන් ගීත ලෙස ද හැඳින්විය හැකිය. ඊට අදාළ යුගය වන්නේ,
(1) හින්දි තනු අනුකාරක යුගය (2) ස්වාධීන තැටි ගී යුගය
(3) නිර්මාණාත්මක තැටි යුගය (4) මුල් යුගය

06 ගීත බොහොමයක් බෙම්ටෝ තාලයට ගැයෙන ගායන විශේෂයකි.
(1) ග්‍රැමෆෝන් (2) නව නාට්‍ය (3) නූර්ති නාට්‍ය (4) කපිරිඤ්ඤා

07 අනාසාතාත්මක ගැමි ගීයකි
(1) දොඩම් කපාලා ඇඹුල් තනාලා (2) රෑ රැසේ අඳිනා ලෙසේ
(3) දඩිබිඩි ගගා කරනා වැඩ (4) රැගත් සුරා පිරූ විතින්

08 සැළලිහිණි සංදේශයේ එන ගීත
(1) සේ ගී ගනයට අයත් වේ. (2) ගැමි ගී ගනයට අයත් වේ.
(3) සමාජ ගී ගනයට අයත් වේ. (4) මෙහෙ ගී ගනයට අයත් වේ.

09 තබ්ලා වාදන අංගයක් නොවන්නේ,
(1) තිහායි (2) තායදා (3) ජලා (4) මුකුඩා

10 සරල ගීතයක "Interlude" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) මුල් වාදන කොටසයි. (2) දෙවන (අතුරු) වාදන කොටසයි.
(3) මුල් ගීතමය කොටසයි. (4) අන්තරා ගීත කොටසයි.

- 11, 12, 13, 14 ප්‍රශ්න සඳහා වගුව බලා පිළිතුරු සපයන්න.

| ගායකයා | ගීතය | ගී වර්ගය |
|---|---|---|
| 1 ආනන්ද සමරකෝන් | i ඕලු පිපීලා විල ලෙල දෙනවා | a ග්‍රැමෆෝන් ගී |
| 2 ග්‍රේටා ජැනට් ද සිල්වා | ii ශ්‍රී රාහුල හිමිගේ නාමේ | b ගුවන් විදුලි සරල ගී |
| 3 සුනිල් ශාන්ත | iii ඇසේ මධුර ජීවිතයේ ගීතා | c චිත්‍රපට ගී |
| 4 ආර්. මුත්තුසාමි | iv ඔංචිල්ලා තොටිලි කොයින්දෝ | d ස්වාධීන ගී |

11 සුනිල් ශාන්තයන් හා බැඳි ගීතයක් හා ගී විශේෂයට අදාළ සංකේතය වනුයේ,
(1) ii, a (2) i, b (3) iii, b (4) iv, d

12 සූර චෞරයා චිත්‍රපටයේ සංගීත අධ්‍යක්‍ෂවරයා හා අදාළ ගීතය ඇතුළත් වන්නේ,

(1) 1, iii (2) 2, i (3) 3, iii (4) 4, iv

13 ග්‍රේටා ජැනට් ද සිල්වා හා බැඳි ගීත විශේෂය වන්නේ,

(1) නිර්මාණාත්මක ගී (2) ග්‍රැමෆෝන් ගී

(3) චිත්‍රපට ගී (4) ගුවන් විදුලි සරල ගී

14 ගුවන් විදුලි සරල ගීත ගායනයේ සුවිශේෂී පුද්ගලයන් දෙදෙනෙක් පිළිබඳ සටහන් වන්නේ,

(1) අංක 1 හා 2 (2) අංක 2 හා 3 (3) අංක 1 හා 4 (4) අංක 3 හා 1

15 වංග සංගීතය ඇසුරින් ගිත නිර්මාණය කළ පුද්ගලයෙකි.

(1) ආනන්ද සමරකෝන් (2) සුනිල් ශාන්ත

(3) ග්‍රේටා ජැනට් ද සිල්වා (4) මුත්තු සාමි

16 ඩබ්. බී. මකුලොලුව මහතා විසින් රචිත කෘතියක් වන්නේ,

(1) සිඟිති ගීත (2) අභිනව මූලික ගීත

(3) හෙළ ගී මග (4) සංගීත රත්නාකරය

17 භෛරවි රාගය ආශ්‍රිතව තනු නිර්මාණය කළ ගීතයක් නොවන්නේ,

(1) පිදුරු සෙවිකළ පැල්පතේ ඇති (2) අඳුර අඳුර මගේ

(3) කවුරුදෝ අර කවුළුවෙන් (4) කුළිඳු ගංගා දෙනියේ

18 දොලොස්මත් සේ ගීයකි

(1) රැගත් සුරා පිරූ විතින් (2) මන්මත් කරවන දන මුළු දෙරනා

(3) රූ රසේ අඳිනා ලෙසේ (4) පුන්මදාරා මල් දමින් මුදු

19 ජප් තාලයේ මාත්‍රා සංඛ්‍යාවත්. දාදරා තාලයේ මාත්‍රා සංඛ්‍යාවත් එකතු කළ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන තාලය වන්නේ,

(1) දීප්චන්දි (2) ත්‍රිතාල් (3) ලාවණී (4) කෙහෙර්වා

20 තබ්ලාවේ කොටස් දෙකින්ම උපදිනා අක්ෂරයකි

(1) න (2) ත (3) ක (4) ධිං

21 ''දුල් නිමල් සිසි දේ දිසි'' මෙම ගීතය අයත් නාඩගම වන්නේ.

(1) බ්‍රම්පෝඩ් (2) වෙස්සන්තර (3) ඉයුජින් (4) කාලගෝල

22 ධ̇ ප ධ̇ | ස - රි | ග - ධ | ප - ප මෙම ස්වර ප්‍රස්තාරය බටහිර සංගීතයට අනුව ප්‍රස්තාර කිරීමේ දී සුදුසු Time signature වන්නේ,

(1) $\frac{4}{4}$ (2) $\frac{3}{4}$ (3) $\frac{5}{8}$ (4) $\frac{7}{8}$

23 මෙහෙ ගී විශේෂයක් ලෙස නම් කළ හැක්කේ,

(1) කළුගල් තලාලයි පාරට දමන්නේ (2) සීත ගඟුලේදී ඇඳ පේවෙනවා

(3) සාර සදිසි පෙති පේර නෙලන කල (4) සම්මා සම්බුදු වෙණ මුනි රජුනේ

24 ''ගල් ලෙන බිඳලා ලෙන් දොර හැරලා'' මෙම ගීතය අයත් නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) ප්‍රේමසිරි කේමදාස

(3) හෙන්රි ජයසේන (4) ලූෂන් බුලත්සිංහල

25 දීප්චන්දි තාලයේ 0 (බලියට) හිමි මාත්‍රාව වනුයේ,

(1) 8 (2) 4 (3) 11 (4) 5

26 මඩකලපුව, හලාවත ප්‍රදේශවල ශීඝ්‍රයෙන් පැතිරී ගිය ගායන විශේෂය

(1) ග්‍රැමෆෝන් (2) නාඩගම් (3) කපිරිඤ්ඤා (4) කෝළම්

27 ජන ගී ආශ්‍රිතව නිර්මාණකරණයේ යෙදුනු පුද්ගලයෙකු නොවන්නේ,

(1) සී. ද එස්. කුලතිලක (2) ඩබ්. බී. මකුලොලුව

(3) හෙන්රි ජයසේන (4) රෝහණ බැද්දගේ

28 ග - - මෙම මාත්‍රා 3 දැක්වීම සඳහා බටහිර ප්‍රස්තාරකරණයේ යොදන සංකේතය වන්නේ, (1) 𝅝. (2) 𝅗𝅥. (3) ♩ ♩ ♩ (4) ♩.

29 පන්තේරුව හා තාලම්පට කුමන භාණ්ඩ වර්ගයට අයත් ද?

(1) සුෂිර වාද්‍ය භාණ්ඩ (2) ඝන වාද්‍ය භාණ්ඩ
(3) අවනද්ධ වාද්‍ය භාණ්ඩ (4) තත් වාද්‍ය භාණ්ඩ

30 අල්ලා රක්ඛා සුප්‍රසිද්ධ

(1) ඛ්‍යාල් ගායකයෙකි. (2) ෂෙනායි වාදකයෙකි.
(3) බටනලා වාදකයෙකි. (4) තබ්ලා වාදකයෙකි.

31 වාදි, සංවාදි ස්වර හැරුණු විට රාගයක ඉතිරි ස්වර හඳුන්වන්නේ,

(1) අනුවාදි ස්වර (2) විවාදි ස්වර (3) වර්ජ ස්වර (4) කන් ස්වර

32 සැළලිහිණි සංදේශයට අයත් ගීතයකි

(1) සඳවා සුදු වැලි පිවිතුරු (2) රූ රුසේ අඳිනා ලෙසේ
(3) පැහැසරණිය මිණි පැමිණිය (4) රුගත් සුරා පිරූ විතින්

33 නව නාට්‍ය ගණයේලා ගත නොහැක්කේ,

(1) මනමේ (2) විදුර (3) සිංහබාහු (4) කාලගෝල

34 ස - | ප - ප | ප - | ප ධ ප මෙම ගී පාදයට සුදුසු තාල රූපය වන්නේ,

(1) බෙම්ටෝ (2) දීප්චන්දි (3) කෙහෙර්වා (4) ජප්තාලය

35 සමූහ ගායනයට සුදුසු වන්නේ,

(1) ගැල් ගී (2) පැල් ගී (3) ඔංචිලිවාරම් (4) පාරු ගී

36 ග - ම | ප - ග | ම - ග | රි - - මෙම ගී පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙනුයේ,

(1) ම - නි | ධ̇ - ම̇ | නි̇ - ධි | ම - -
(2) ප - <u>නි</u> | රි̇ - ස | ස - නි | ධ - -
(3) ධ - <u>නි</u> | ස - ධ | <u>නි</u> - ධ | ප - -
(4) ම - ප | ධ - ප | නි - ධ | ම - -

37 ගට්ටා, මෛදාන්, චාන්ට්, ෂ්‍යාහි වැනි කොටස් ඇතුළත් වන හින්දුස්ථානි වාද්‍ය විශේෂය වන්නේ,

(1) සිතාර් (2) තබ්ලාව (3) ගැටබෙරය (4) දවුල

38 කපිරිඤ්ඤා ගීතවල දක්නට ලැබෙන ලක්ෂණයකි

(1) අත්වැල් ගායනය සමග ප්‍රධාන ගායකයෙකු සිටීම.
(2) ප්‍රේමය මුල්කොටගෙන ගීත ශෛලිය බිහිවීම.
(3) රිද්මය මුල්කොටගෙන චලනයෙහි යෙදෙමින් සාමූහිකව ගැයීමට හැකිවීම.
(4) විශාල භාණ්ඩ ප්‍රමාණයක් යොදාගැනීම.

39 සෙමිබ්‍රීව් එකකට අයත් ක්‍රොචර්ට් මාත්‍රා ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 1½ කි.

40 දෘශ්‍ය කාව්‍ය ගී විශේෂයකි

(1) ගැල් ගී (2) පාරු ගී (3) නූර්ති ගී (4) පතල් ගී

(2 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) සර්ගම් සඳහා භාවිතාවන තවත් නමක් සඳහන් කරන්න.
(2) භෛරවී රාගයේ මුඛ්‍යාංගය ලියා දක්වන්න.
(3) මනමේ නාට්‍යයේ එන ගීතයක මුල් පේළිය ලියා දක්වන්න.
(4) ජප් තාලයේ මාත්‍රා ගණන කීයද?
(5) ජන ගී ආශ්‍රිත සරල ගීතයක් නම් කරන්න.
(6) ජනප්‍රිය සංගීතයේ භාවිතා වන වාද්‍ය භාණ්ඩ 2 ක් ලියා දක්වන්න.

(7) යේකාව කෙටියෙන් හඳුන්වන්න.

(8) ග්‍රැමෆෝන් තැටි සඳහා මුල් යුගයේ සම්බන්ධ වූ ගායකයින් දෙදෙනෙක් ලියා දක්වන්න.

(9) යමන් රාගයට අදාළව ස්වර සංගතියක් ලියා දක්වන්න.

(10) අනුතාලස්ථාන නොමැති තාල 2 ක් නම් කරන්න. ( ල . 12)

02 (1) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල. 04)

| රාගය | මේලය | ජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදි | සංවාදි | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|---|---|---|
| යමන් | | | | | | | |
| භෛරවි | | | | | | | |

(2) යමන් රාගයට අයත් ලක්ෂණ ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)

(3) භෛරවී රාගය ආශ්‍රිත සරල ගීතයක් ලියා දක්වන්න. ( ල . 04)

03 (1) තබ්ලාවේ කොටස් දෙක වෙන වෙනම නම් කරන්න. ( ල . 02)

(2) එහි වම් කොටසින් උපදිනා අක්ෂර 2 ක් හා දකුණු කොටසින් උපදිනා අක්ෂර 2 ක් ලියා දක්වන්න. (ල. 02)

(3) තබ්ලාවේ වම සහ දකුණෙහි කොටස් 2 බැගින් නම් කරන්න. (ල. 02)

(4) සුප්‍රසිද්ධ තබ්ලා වාදකයින් (ඉන්දීය) දෙදෙනෙකු සඳහන් කරන්න. (ල. 02)

(5) තබ්ලා වාදනයක අංග 2 ක් ලියා දක්වන්න. (ල. 02)

(6) තබ්ලාවෙන් වාදනය කරනු ලබන මාත්‍රා 14 ක තාලය ප්‍රස්තාර කරන්න. (ල. 02)

04 පහත සඳහන් ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.

A කළුගල් තලාලයි පාරට දමන්නේ

B සම්මා සම්බුදු වෙණ මුණි රජුනේ

C අතකට ගෙන රබන් පොඩිය ගසති දිසිරුවින්

D මන්මත් කරවන දන මුළු දෙරණා

(1) ඉහත A, B, C, D ගී පාදවලට අයත් ජන ගී වර්ග වෙන වෙනම ලියා දක්වන්න. (ල. 03)

(2) එම ජන ගී වර්ගවලට අදාළව වෙනත් ජන ගීතය බැගින් ලියා දක්වන්න. (ල. 03)

(3) සේගීවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ල. 03)

(4) ඔබ උගත් ගැමි ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ( ල . 03)

05




(1) ඉහත බටහිර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන්න. ( ල . 05)